චක්‍රලේඛ අංක 05/2025

# <u>රාජ්‍ය නර්තන උලෙළ - 2025</u>
# <u>චක්‍රලේඛය</u>

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා කලා මණ්ඩලය සහ රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලය විසින් සංවිධානය කරනු ලබන **"<u>රාජ්‍ය නර්තන උලෙළ -2025</u>"** සඳහා අයදුම්පත් භාර ගැනේ.

**01. අයදුම් කිරීම**

මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත අනුව සකස් කරගත් අයදුම්පත්‍ර 2025.05.30 වෙනි දිනට ප්‍රථම සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත භාර දිය යුතු ය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"<u>රාජ්‍ය නර්තන උලෙළ - 2025</u>"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

**02. තරග පැවැත්වීම**

I. පළමු වටයේ තරග දිස්ත්‍රික් මට්ටමෙන් පවත්වනු ලැබේ. එක් එක් තරග ශීර්ෂ සඳහා ලැබෙන අයදුම්පත්‍ර සංඛ්‍යාව අනුව දිස්ත්‍රික් කිහිපයක් එක් මධ්‍යස්ථානයකට කැඳවීමට ඉඩ ඇත.

II. දිස්ත්‍රික් මට්ටමෙන් ප්‍රථම ස්ථානය ලබාගත් නර්තන කණ්ඩායම් ජාතික තරගය සඳහා කැඳවනු ලැබේ.

**03. තරග කාලසටහන**

- දිස්ත්‍රික් තරගාවලිය
- ජාතික තරගාවලිය
- සම්මාන ප්‍රදානෝත්සවය

**04. තරග කොන්දේසි**

I. කලායතන, සංස්කෘතික මධ්‍යස්ථාන, පාසල්, උසස් අධ්‍යාපන ආයතන, විශ්වවිද්‍යාල ආදී ඕනෑම ආයතනයකට මේ සඳහා ඉදිරිපත් විය හැකිය. විවෘත අංශයේ තරග සඳහා පමණක් පෞද්ගලික මට්ටමින් අයදුම් කළ හැකි ය.

II. සිංහල හා දෙමළ භාෂාද්වයෙන් තෝරා ගනු ලබන නර්තන නිර්මාණ සඳහා සම්මාන පිරිනැමේ.

III. එක් එක් තරග අංශ සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IV. අයදුම්පත සමග දිස්ත්‍රික් තරග සඳහා ඉදිරිපත් කරන ශිල්පී නාම ලේඛනය අවසන් වටයේ දී වෙනස් කළ නොහැකිය.

V. සමූහ නර්තන අංගයක් සඳහා ගායන, වාදන ශිල්පීන් හැර සහභාගි විය යුතු අවම ශිල්පීන් / ශිල්පිනියන් සංඛ්‍යාව 08කි. උපරිම 24කි. මිශ්‍ර තරග ශීර්ෂ සඳහා ගැහැනු, පිරිමි උචිත අනුපාතයකට

අනුව යොදා ගත යුතුය. (ඊට අමතරව ගායනය හා වාදනය සඳහා සහභාගී විය හැක්කේ උපරිමය 08 දෙනෙකුට පමණි.)

VI. නර්තන අංග ඉදිරිපත් කළ හැක්කේ එක් උපදේශකවරයෙකු යටතේ එක් ආයතනයකින් පමණක් වන අතර, එක් ආයතනයකින් ඉදිරිපත් කළ හැකි උපරිම තරග අංශ සංඛ්‍යාව 03 කි. (ඒකල 01 කි. සමූහ 02 කි.)

VII. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට තරග සඳහා ඉදිරිපත් වන ශිල්පීන්/ශිල්පිනියන්ගේ නියමිත වයස් සීමාව සම්පූර්ණව තිබිය යුතුය. (වයස් සීමාව සනාථ කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ උප්පැන්න සහතිකය අවසන් වටයේ තරග පැවැත්වෙන දිනයේදී ඉදිරිපත් කළ යුතුය.)

VIII. දිස්ත්‍රික් තරගාවලිය සඳහා සහභාගී වන සියලුම තරගකරුවන් උචිත පුහුණු ඇඳුම් කට්ටලයක් භාවිත කළ යුතු වේ. අවසන් වටය හෙවත් ජාතික තරගය සඳහා එක් එක් නර්තනාංගයට නියමිත රංගවස්ත්‍රාභරණ භාවිතය අනිවාර්ය වේ.

IX. කිසියම් තරග අංකයක් දිස්ත්‍රික් තරගයේ දී ප්‍රථම ස්ථානය දිනා ගනු ලැබූ අවස්ථාවක දී හෝ නිතරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගනු ලැබූ අවස්ථාවක දී එය දුර්වල අංකයක් ලෙස විනිශ්චය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබුවහොත් එකී තරග අංකය අවසන් තරග වටය සඳහා නිර්දේශ නොකිරීමට විනිශ්චය මණ්ඩලයට බලය ඇත.

X. ඉහත තරග කොන්දේසි උල්ලංඝනය කළහොත් නර්තන කණ්ඩායම හෝ කණ්ඩායම් සමූහය තරගාවලියෙන් ඉවත් කිරීමේ බලය විනිශ්චය මණ්ඩලය සතු වන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

XI. සාම්ප්‍රදායික නර්තනය හා වාදනය සඳහා ඉදිරිපත් වීමේදී නර්තනයට අනුචිත ලෙස ඉදිරිපත් වීම ඔබව අදාළ තරග අංශයෙන් ඉවත් කිරීමට හේතු වේ.(රැවුල් වවා තිබීම හෝ ශරීරය පුරා පච්ච කොටා තිබීම වැනි නොගැලපෙන අයුරින් තරගයට ඉදිරිපත් වීම මෙම තරගය සඳහා නුසුදුස්සෙකු ලෙස සැලකීමට හේතුවේ.)

XII. නර්තනය, වාදනය ඉදිරිපත් කිරීමේදී සුදුසු පුහුණු ඇඳුම් කට්ටලයකින් සැරසී සිටිය යුතුය.

දේශීය නර්තනාංගයක් සඳහා



හෝ



වාදනය සඳහා



හෝ



ඉන්දියානු නර්තනාංගයක් සඳහා





XIII. විදේශීය නර්තනාංගයක් නම් එය ඉදිරිපත් කිරීම සුදුසු පුහුණු ඇඳුමක් භාවිත කළ යුතු ය.

XIV. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන නර්තනාංගය ස්වකීය නිර්මාණයක් බවට තහවුරු කර ගැනීම සඳහා ඔබ පදිංචි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරී/සංස්කෘතික සංවර්ධන සහකාර/ සංස්කෘතික සංවර්ධන නිලධාරී යන නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන (නිලමුද්‍රාව සහිතව) ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ගෙනැවිත් භාරදීමට හෝ ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතු ය.

XV. සියලු නිර්මාණ තේරීම ජාතික මට්ටමේ ස්වාධීන, ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් සිදු කරන අතර, ජයග්‍රාහී නිර්මාණ තෝරා ගැනීම පිළිබඳ ඔවුන්ගේ තීරණය අවසාන තීරණය වේ.

XVI. චක්‍රලේඛය අනුව, තරග සඳහා ඉල්ලුම් කිරීම සියලු තරග කොන්දේසිවලට එකඟවීමක් සේ සැලකේ.

XVII. මෙම තරගාවලිය සඳහා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතනවල සේවය කරන නිලධාරීන්ට හෝ ඔවුන්ගේ නමින් වන කණ්ඩායම් සඳහා සහභාගි විය නොහැක.

XVIII. ඔබ විසින් ඉදිරිපත් කිරීමට අපේක්ෂිත තරග නිර්මාණ, අදාළ තරග අංශය පැහැදිලිව ඔබේ අයදුම්පතෙහි සඳහන් කළ යුතු වේ. අයදුම්පත බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ රාජ්‍ය නර්තන උලෙළ -2025 හා තරග ශිර්ෂය පැහැදිලිව සඳහන් කර, අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. යන ලිපිනයට 2025 මැයි මස 30 වෙනි දින ප.ව 4.00 පෙර ගෙනවිත් භාරදීමට හෝ ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතු ය.

XIX. තරග අයදුම්පත් ඕනෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින් හෝ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැකිය. නැතහොත් අයදුම්පත හා ඊට අදාළ චක්‍රලේඛය www.culturaldept.gov.lk යන වෙබ් අඩවියෙන් හා Department of Cultural Affairs යන Facebook පිටුවෙන් බාගත (download) කර ගත හැකිය. වැඩිවිස්තර දුරකථන අංක 0112-872030 / 0112872031 ඇමතීමෙන් ලබා ගත හැකි ය.

## 05. ජයග්‍රාහකයන් ඇගයීම

ජාතික තරගාවලියේ ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන සඳහා මුදල් ත්‍යාග සහ සහතික පත්‍ර පිරිනමන අතර, ප්‍රථම ස්ථානය සඳහා මුදල් ත්‍යාග හා සහතික පත්‍රවලට අමතරව සම්මාන තිළිණ ප්‍රදානය කරනු ලැබේ. **දිස්ත්‍රික් තරගාවලියේ** ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන සඳහා සහතික පත්‍ර පිරිනැමීම සිදු කෙරේ.

## 06. තරග පැවැත්වීම

I. දිස්ත්‍රික් තරග සඳහා ඉදිරිපත් වීමේදී ඊට අදාළ වන පුහුණුවීම් ඇඳුම් කට්ටලයෙන් සැරසී සිට තරගයට ඉදිරිපත් විය යුතු ය.

II. දිස්ත්‍රික් මට්ටමින් ප්‍රථම ස්ථානය ලබාගත් නර්තන කණ්ඩායම් ජාතික තරගය සඳහා කැඳවනු ලැබේ. අවසාන වටය සඳහා තෝරා ගනු ලැබූ තරගකරුවන් අදාළ රංගවස්ත්‍රාභරණයෙන් සැරසී නර්තන නිර්මාණය ඉදිරිපත් කළ යුතු ය.

## 07. තරග කාලසටහන

- දිස්ත්‍රික් තරගාවලිය (පළමු වටය)
  සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලය මෙහෙයවීමෙන් දිස්ත්‍රික් වෙත ගොස් අදාළ තරග පවත්වනු ලැබේ.
- ජාතික තරගාවලිය ( අවසාන වටය)
  දිස්ත්‍රික් මට්ටමින් ප්‍රථම ස්ථානය ලබාගත් නර්තනාංග කොළඹ පිහිටි තෝරාගත් රංගශාලාවක දී රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලය මවිසින් පත් කරනු ලබන විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ සජීවී ලෙස ඉදිරිපත් කළ යුතු ය.
- සම්මාන ප්‍රදානෝත්සවය
  රාජ්‍ය නර්තන සම්මාන ප්‍රදානෝත්සවය, - 2025 තෝරාගත් සුදුසු රංග ශාලාවක දී පවත්වනු ලැබේ.

## 08. තරගය සඳහා ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකි අවස්ථා

(අ) නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) ප්‍රමාද වී ලැබෙන සහ තරග කොන්දේසිවලට පටහැනි අයදුම්පත් පෙර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

# රාජ්‍ය නර්තන උළෙල - 2025

## (තරග ශීර්ෂ)

## 01. වයස් කාණ්ඩය අවු : 10 – 15

### 1.1 නිර්මාණාත්මක සමූහ නර්තන - "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්"

විශේෂ උපදෙස්

- මාතෘකාවට අදාළ විය යුතු ය.
- නර්තනය ප්‍රධාන මාධ්‍ය ලෙස යොදා ගත යුතු ය.
- ගායන යොදා ගත හැකි ය.
- නිර්මාණයේ අවශ්‍යතාව මත ඕනෑම සංගීත භාණ්ඩයක් යොදා ගත හැකිය. සංගීතය සජීවී විය යුතු ය.
- පිරිමි/ කාන්තා/ මිශ්‍ර ලෙස ප්‍රභේද නොකෙරේ. ඉදිරිපත් කරන අංග අතරින් ප්‍රථම, දෙවන සහ තුන්වන ස්ථාන තෝරා ගනු ඇත.
- නර්තන නිර්මාණයෙහි ප්‍රශස්ත බව, මාතෘකාවට අදාළ බව, චලන ඖචිත්‍යය, ගායන - වාදන - නර්තන සමායෝජනය, රංග වින්‍යාසය සහ ප්‍රාසංගික බව තරග විනිශ්චයේ දී අවධානයට යොමු කෙරේ.
- කාලය වි.04 - 06 අතර විය යුතු ය.

### 1.2 නිර්මාණාත්මක සමූහ වාදන - සටන් කවි ආශ්‍රිත සමූහ වාදනය ( ගායනය සහිතව)"

විශේෂ උපදෙස්

- තේමාවට අදාළව පමණක් මාතෘකා කරගත යුතු ය.
- සාම්ප්‍රදායික දේශීය වාදන භාණ්ඩ සහ ආදේශ භාණ්ඩ යොදා ගත යුතු ය.
- පිරිමි / කාන්තා / මිශ්‍ර වශයෙන් ඉදිරිපත් විය හැකි ය.
  තරග විනිශ්චයේ දී පිරිමි / කාන්තා / මිශ්‍ර ලෙස ප්‍රභේද නොකෙරේ. ඉදිරිපත් කරන අංග අතරින් ප්‍රථම, දෙවන සහ තුන්වන ස්ථාන තෝරා ගනු ලැබේ.
- වාදනය මඟින් තේමාව ප්‍රකාශ වීම, නිර්මාණයේ ප්‍රශස්ත බව, වාදන භාණ්ඩ සමායෝජනයේ ඖචිත්‍යය බව, වාදන හැකියාව, ඉදිරිපත් කිරීමේ ප්‍රාසංගිකත්වය විනිශ්චයේ දී සැලකිල්ලට ගැනේ.
- කාලය වි : 05 - 07 අතර විය යුතු ය.

## 02. වයස් කාණ්ඩය අවු : 16 – 22

### 2.1 නව නිර්මාණාත්මක සමූහ නර්තන - ශාන්තිකර්ම උපත් කතා ඇසුරෙන් නර්තන අවස්ථා නිර්මාණයක් අපේක්ෂා කෙරේ.

විශේෂ උපදෙස්

- කවර හෝ දේශීය ශාන්තිකර්මයක එන උපත්කතාවක අවස්ථාවක් නිර්මාණශීලී ලෙස ඉදිරිපත් කළ යුතු ය.
- නර්තනය ප්‍රධාන මාධ්‍ය ලෙස යොදා ගත යුතු ය.
- ගායනය යොදා ගත හැකි ය.
- පසුබිම් වාදනය සඳහා දේශීය වාදන භාණ්ඩ පමණක් යොදා ගත යුතු ය.
- පිරිමි / කාන්තා / මිශ්‍ර වශයෙන් ඉදිරිපත් විය හැකි ය. තරග විනිශ්චයේ දී පිරිමි / කාන්තා / මිශ්‍ර ලෙස ප්‍රභේද නොකෙරේ. ඉදිරිපත්වන නර්තන අංග අතරින් ප්‍රථම, දෙවන හා තුන්වන ස්ථාන තෝරාගනු ලැබේ.

- නර්තන නිර්මාණයේ ප්‍රශස්තබව, තේමාව ප්‍රකාශ වීම, නර්තන භාවිතයෙහි ඖචිත්‍යය බව, ගායන, වාදන සහ නර්තනයේ සමායෝජනය, විචිත්‍රත්වය, විවිධත්වය හා ප්‍රාසංගික බව විනිශ්චයේ දී සැලකිල්ලට ගැනේ.
- කාලය වි : 04 - 06 අතර විය යුතු ය.

## 2.2 සමූහ ශාස්ත්‍රීය නර්තන

**2.2.1 උඩරට නර්තන ශාස්ත්‍රීය කාන්තා - පලවැල දානය**
**2.2.2 උඩරට නර්තන ශාස්ත්‍රීය පිරිමි - කොහොඹා හැල්ල**
**2.2.3 උඩරට නර්තන ශාස්ත්‍රීය මිශ්‍ර - කෝල්මුර නර්තනය**

**2.2.4 පහතරට නර්තන ශාස්ත්‍රීය කාන්තා - නාානුමුරය**
**2.2.5 පහතරට නර්තන ශාස්ත්‍රීය පිරිමි - යහන් දැක්ම**
**2.2.6 පහතරට නර්තන ශාස්ත්‍රීය මිශ්‍ර - විෂ්ණු මල් අස්න**

**2.2.7 සබරගමු නර්තන ශාස්ත්‍රීය කාන්තා - සමන් දෙවි මල් යහන් කවි**
**2.2.8 සබරගමු නර්තන ශාස්ත්‍රීය පිරිමි - සේරමාන් මඩු පූරය**
**2.2.9 සබරගමු නර්තන ශාස්ත්‍රීය මිශ්‍ර - තාල නවයේ ග්‍රහ පන්ති ඇසුරින්**

<u>විශේෂ උපදෙස්</u>

- සම්ප්‍රදායට අදාළ ශාස්ත්‍රීය ලක්ෂණ ආරක්ෂා විය යුතු ය.
- සාම්ප්‍රදායික ලක්ෂණයන්ට අනුගත බව, රංග වින්‍යාසය, ප්‍රාසංගික බව විනිශ්චයේ දී සැලකිල්ලට ගැනේ.
- කාලය වි : 04 - 06 අතර විය යුතු ය.

## 2.3 සමූහ ජන නැටුම්

**2.3.1 ගොයම්, ලී කෙළි (කාන්තා සමූහ)**
**2.3.2 කඩු, පතුරු (පිරිමි සමූහ)**
**2.3.3 රබන්, තාලම් (මිශ්‍ර සමූහ)**

<u>විශේෂ උපදෙස්</u>

- මාතෘකාවට උචිත ජන නැටුම් නිර්මාණයක් විය යුතු ය.
- ගායනය සහිත විය යුතු ය.
- පිරිමි/ කාන්තා/ මිශ්‍ර වශයෙන් ඉදිරිපත් කළ හැකිය. තරග විනිශ්චයේ දී පිරිමි/ කාන්තා/ මිශ්‍ර ලෙස ප්‍රභේද නොකෙරේ. ඉදිරිපත්කරන නර්තන අංග අතරින් ප්‍රථම, දෙවන හා තුන්වන ස්ථාන තෝරාගනු ඇත.
- තරග විනිශ්චයේ දී උපකරණ භාවිතයට, ගායන වාදන නර්තන සුසංයෝගය, තාල රූප විවිධත්වය, රංගරචනය සහ ප්‍රාසංගික බව සැලකිල්ලට ගැනේ.
- කාලය වි : 04 - 06 අතර විය යුතු ය.

## 2.4 සමූහ වාදන - සාම්ප්‍රදායික වාදන භාණ්ඩ ඇසුරින් කරනු ලබන නිර්මාණාත්මක වාදනයක්

<u>විශේෂ උපදෙස්</u>

- තාල රූප විවිධත්වය ප්‍රදර්ශනය විය යුතුය.

- සාම්ප්‍රදායික පද සහ නිර්මාණාත්මක පද ඇසුරු කර ගත හැකිය.
- අවනද්ධ, සුසිර සහ ඝන කුලකයන්ට අයත් දේශීය වාද්‍ය භාණ්ඩ යොදා ගත යුතුය.
- වාදන නිපුණත්වය, පද සංයෝජනය, තාල රූප විවිධත්වය ප්‍රාසංගික ඉදිරිපත් කිරීම යන නිර්ණායකයන් තරග විනිශ්චයේ දී සැලකිල්ලට ගැනේ.
- කාලය වි : 05 - 07 අතර විය යුතු ය.

## 03. විවෘත අංශය - වයස් කාණ්ඩය අවු : 20 - 35

**3.1.1 උඩරට නර්තනය ඒකල කාන්තා - පඩුවස් කතාව**

**3.1.2 උඩරට නර්තන ඒකල පිරිමි - යක් තුන් පදය**

**3.1.3 පහතරට නර්තන ඒකල කාන්තා - නාග කන්‍යා (වෙස් මුහුණු සහිතව)**

**3.1.4 පහතරට නර්තන ඒකල පිරිමි - ලිච්ඡවී නර්තනය (කුමාර පෙලපාළිය)**

**3.1.5 සබරගමු නර්තන ඒකල කාන්තා - සළු පාලිය**

**3.1.6 සබරගමු නර්තන ඒකල පිරිමි - අඟුරු දුම්මල පාලිය**

විශේෂ උපදෙස්

- සාම්ප්‍රදායික ශාස්ත්‍රීය ලක්ෂණ ආරක්ෂා විය යුතු ය.
- සාම්ප්‍රදායට හානියක් නොවන පරිදි උචිත අවස්ථා අනුපිළිවෙළ ගොඩනඟා ගත හැකි ය.
- ගායනය යොදා ගත යුතු ය.
- තරග විනිශ්චය කිරීමේ දී සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා කර ගැනීම, අංගහාර පිරිසිදු බව, තාලය සහ ලය පවත්වා ගැනීම, පද සංයෝජනයෙහි ඖචිත්‍යය බව, ශිල්පීය නිපුණතාව, ප්‍රාසංගික බව සැලකිල්ලට ගනු ඇත.
- කාලය වි : 04 - 06 අතර විය යුතු ය.

### 3.2 කතක් නර්තන

**3.2.1 තරානා (සමූහ)**

**3.2.2 බජන් (ඒකල)**

විශේෂ උපදෙස්

- ශාස්ත්‍රීය ලක්ෂණ ආරක්ෂා විය යුතුය.
- සාම්ප්‍රදායික ලක්ෂණයන්ට අනුගත බව, රංග වින්‍යාසය, ප්‍රාසංගික බව විනිශ්චයේ දී සැලකිල්ලට ගැනේ.
- කාලය වි : 05 - 06 අතර විය යුතුය.

### 3.3 ඒකල වාදන

3.3.1 **ගැටබෙර වාදන කාන්තා - මඟුල් බෙර වාදනය (පළමු හා දෙවන වට්ටම් ඇසුරෙන්)**

3.3.2 **ගැටබෙර වාදන පිරිමි - අත්‍යා බෙර සහ විවිධ තිත් රූප 4 ක්ඇසුරු කරගත් වාදනයක්**

3.3.3 **පහතරට බෙර වාදන කාන්තා - මගුල් බෙර වාදනය**

3.3.4 **පහතරට බෙර වාදන පිරිමි - සතර වට්ටම් සුරල් මූලික කරගත් වාදනයක්**

3.3.5 **සබරගමු දවුල් වාදන කාන්තා - අත්‍යා දවුල් පද ඇසුරින් දවුල් වාදනය**

3.3.6 **සබරගමු දවුල් වාදන පිරිමි - මහා මංගල දවුල් වාදනය**

විශේෂ උපදෙස්

- මංගල භේරී වාදනයේ දී වට්ටම් ඇසුරෙන් උචිත ලෙස පද සංයෝජනය කර ගත හැකි ය.

- තරග විනිශ්චය කිරීමේ දී පද සංයෝජනය, අක්ෂර උත්පාදනය, සුරල් හා පෙරලුම්, ශිල්පීය ප්‍රාගුණ්‍යය, සාම්ප්‍රදායික පදනම සැලකිල්ලට ගනු ඇත.
- කාලය වි : 05 - 06 අතර විය යුතු ය.

3.3.7 **හේවිසි වාදනය උඩරට**

**3.3.8 හේවිසි වාදනය පහතරට**

**3.3.9 හේවිසි වාදනය සබරගමු**

<u>විශේෂ උපදෙස්</u>

- හැන්දෑදූරය ඇසුරු කරගත යුතු ය.
- දවුල, තම්මැට්ටම සහ හොරණෑව යොදා ගත යුතු ය.
- තරග විනිශ්චයේ දී සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂාවීම, ශිල්පීය නිපුණතාව, සාමූහිකත්වය, ප්‍රාසංගික ලක්ෂණ සැලකිල්ලට ගනු ඇත.
- කාලය වි : 05 - 07 අතර විය යුතු ය.

**3.4.1 පන්තේරු නැටුම් - (මිශ්‍ර සමූහ)**

**3.4.2 උඩැක්කි - (සමූහ පිරිමි )**

<u>විශේෂ උපදෙස්</u>

- පන්තේරු නර්තනයේ සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා විය යුතු ය. (පන්තේරු භාවිතය)
- පන්තේරු නර්තනයේ දී සූවිසි විවරණ ගායනා යොදා ගත යුතු ය.
- උඩැක්කි නර්තනයේ සාම්ප්‍රදායික ලක්ෂණ ආරක්ෂා විය යුතු ය. (උඩැක්කි භාවිතය)
- තාල රූප විවිධත්වය සහ නාද මාලා විවිධත්වය ප්‍රකට විය යුතු ය.
- ප්‍රාසංගික විය යුතු ය.
- කාලය වි : 04 - 06 අතර විය යුතු ය.

උක්ත චක්‍රලේඛය රාජ්‍ය නර්තන උලෙළ සම්බන්ධ එකම තීරණාත්මක ලියවිල්ල වන අතර, මෙම තරගාවලිය සම්බන්ධ වෙනත් පැහැදිලි කිරීම් අවශ්‍ය වෙතොත් රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලය මගින් ලිඛිතව හෝ දුරකථන මාර්ගයෙන් දැනුම් දෙනු ඇත. මෙම චක්‍රලේඛය අර්ථකථනය කිරීම, සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම හෝ නව චක්‍රලේඛයක් සම්පාදනය කිරීමේ පූර්ණ වගකීම රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලය සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතු වේ.

කේ.එස්. දිල්හානි
අධ්‍යක්ෂ
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

කේ.එස්. දිල්හානි
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ

විමසීම : 0112 872031 / **0112 872030**
ලේකම්, රාජ්‍ය නර්තන හා මුද්‍රා නාට්‍ය අනුමණ්ඩලය.
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.
2025.05.05

# රාජ්‍ය නර්තන උලෙළ - 2025

## ආදර්ශ අයදුම් පත්‍රය

01. ඉදිරිපත් වන ආයතනයේ නම : ..................................................................................................

02. කණ්ඩායම් භාරකරුගේ නම:.........................................................................................................

03. ලිපිනය : .......................................................................................................................

04. දුරකථන අංක : ජංගම (WhatsApp) : .................................... නිවස : ....................................

ඊමේල් ලිපිනය : .........................................................................................

05. වයස් කාණ්ඩය : .......................................................................................................................

06. අංකය හා තරග ශීර්ෂයේ නම : .......................................................................................

07. සහභාගි වන තරගකරුවන් සංඛ්‍යාව :.........................................................................................

(සහභාගි වන ශිල්පි/ ශිල්පිනියන්ගේ නාම ලේඛනය සහ හැඳුනුම්පත් අංක සඳහන් පැහැදිලි ලේඛනයක් පසුපිටෙහි අමුණන්න)

08. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය : .........................................................................................

09. දිස්ත්‍රික්කය : .......................................................................................................................

**10. අයදුම්කරුගේ ප්‍රකාශය:**

........................................................(අයදුම්කරුගේ නම) වන මම 2025 රාජ්‍ය නර්තන උලෙළේ තරග කොන්දේසිවලට එකඟ වන බවත්,විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස පිළිගන්නා බවත් සඳහන් කරමි.

මවිසින් ඉදිරිපත් කර ඇති..........................................................................................(තරග අංශයේ නම) නර්තනාංගය 2025 රාජ්‍ය නර්තන සම්මාන උලෙළ සඳහා ඉදිරිපත් කිරීමට හිමිකම හා බලය මා වෙත පැවරී ඇති බවත්, මේ පිළිබඳව හිමිකම් කීමට වෙනත් කිසිවෙකු හෝ ආයතනයක් හෝ නොමැති බවත් සහතික වෙමි.යම් ආකාරයක ගැටලුවක් මතු වුවහොත් එහි වගකීම මා විසින් භාරගනු ලබන බවත්, එය සමථ කරදීම සඳහා මම කටයුතු කරන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

අයදුම්කරුගේ නම:..........................................................................................................

දිනය:........................................................ අත්සන..........................................................

**11. ආයතනික නිර්දේශය**

.......................................................................................................................(අයදුම්කරුගේ නම) විද්‍යාලය/කලායතනය/සංස්කෘතික මධ්‍යස්ථානය/උසස් අධ්‍යාපන ආයතනය/විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කර ඇති.......................................................................................(තරග අංශයේ නම) නර්තනාංගය මෙම විද්‍යාලයේ/කලායතනයේ/සංස්කෘතික මධ්‍යස්ථානයේ/උසස් අධ්‍යාපන ආයතනයේ/විශ්වවිද්‍යාලයේ නිර්මාණයක් බවත්, 2025 - රාජ්‍ය නර්තන උලෙළට ඉදිරිපත් කිරීමට නිර්දේශ කරන බවත් ප්‍රකාශ කරමි. යම් ආකාරය ගැටලුවක් මතු වුවහොත් එහි වගකීම මා විසින් භාරගනු ලබන බවත්, එය සමථ කරදීම සඳහා මම කටයුතු කරන බවත් මෙයින් ප්‍රකාශ කරමි.

ආයතන ප්‍රධානියාගේ නම : ..........................................................................................

නිල නාමය : ..........................................................................................

දිනය:........................................................ අත්සන..........................................................

(නිල මුද්‍රාව)

## 12. සංස්කෘතික නිලධාරිගේ නිර්දේශය

........................................................................................................................ (අයදුම්කරුගේ නම) විද්‍යාලය/කලායතනය/සංස්කෘතික මධ්‍යස්ථානය/උසස් අධ්‍යාපන ආයතනය/විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කර ඇති.................................................................................................................................................. (තරග අංශයේ නම) නර්තනාංගය මෙම විද්‍යාලයේ/කලායතනයේ/ සංස්කෘතික මධ්‍යස්ථානයේ/උසස් අධ්‍යාපන ආයතනයේ/විශ්වවිද්‍යාලයේ නිර්මාණයක් බවත්, 2025- රාජ්‍ය නර්තන උලෙළට ඉදිරිපත් කිරීමට නිර්දේශ කරන බවත් ප්‍රකාශ කරමි.

සංස්කෘතික නිලධාරිගේ නම : ..........................................................................................

දිනය:...................................................... අත්සන.........................................................

(නිල මුද්‍රාව)

## රාජ්‍ය නර්තන උලෙළ - 2025

## තරඟයට ඉදිරිපත්වන ශිල්පීන්ගේ නාම ලේඛනය

**(මෙම ලේඛනය අයදුම්පතට අමුණා එවිය යුතුය)**

කලායතනයේ / ආයතනයේ නම : ....................................................................................................................

කණ්ඩායම් භාර නිලධාරියාගේ නම : ....................................................................................................................

කණ්ඩායම් භාර නිලධාරියාගේ දුරකථන අංකය : ....................................................................................................

අංකය සහිතව තරඟ ශීර්ෂයේ නම : ....................................................................................................................

| අනු අංකය | නම | ජා.හැ.අංකය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |